**People's Insurance PLC,** No. 07, Havelock Road, P.O. Box 215, Colombo 05.
Tel: +94 11-2126 126 | Fax: +94 11-2126 109 | E-mail: pilassist@plc.lk | www.peoplesinsurance.lk
(A Subsidiary of People's Leasing & Finance PLC and People's Bank) - Company No. PB 3754 PQ

PEOPLE'S INSURANCE
EMPOWERING A RESILIENT NATION

# බොයිලේරු සහ පීඩන භාජන රක්ෂණය - රක්ෂණ සැලසුම් පිළිබඳ තොරතුරු ලේඛනය

**ඔප්පු වර්ගය:** බොයිලේරු සහ පීඩන භාජන රක්ෂණය

## ලබා දෙනු ලබන මූලික ආවරණය:

පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් සමාගම විසින් රක්ෂිතයාට වන්දි ගෙවනු ලැබේ:

**I වැනි කොටස** : උපලේඛනයේ විස්තර කර ඇති බොයිලේරුවට/පීඩන භාජනයට (ගින්නෙන් හැර) සිදුවන හානි.

**II වැනි කොටස** : අ) රක්ෂිතයාට අයත් වෙනත් දේපලට (ගින්නෙන් හැර) සිදුවන හානි.
ආ) රක්ෂිතයාගේ රැකවරණයේ, භාරයේ හෝ පාලනයේ ඇති දේපලකට (ගින්නෙන් හැර) සිදුවන හානි සඳහා වන නෛතික වගකීම්.

**III වැනි කොටස** : රක්ෂිත බොයිලේරුව/පීඩන භාජනය පුපුරා යාම හෝ කඩාවැටීම නිසා පමණක් එහි අනුෂංගයක් වශයෙන් පහත සඳහන් කරුණු සඳහාවන නෛතික වගකීම
අ) ඕනෑම තෙවන පාර්ශවීය පුද්ගලයකුට සිදුවන මරණය හෝ ශාරීරික තුවාල
ආ) තෙවන පාර්ශවයන්ට අයත් දේපලට සිදුවන හානි (රක්ෂිතයාට අයිති නොවන හෝ භාරයේ නොතිබෙන)

මෙයට අමතරව, පහත සඳහන් කරුණුවලට එරෙහිව ද සමාගම රක්ෂිතයාට වන්දි ගෙවනු ඇත:

1) ඕනෑම හිමිකම් පාන්නෙකු විසින් රක්ෂිතයාගෙන් අයකරගත හැකි සියලු වියදම් සහ නඩු වියදම්, සහ
2) සමාගමේ ලිඛිත අවසරයක් ඇතිව දරන ලද සියළුම වැය සහ වියදම්

*(මූලික ආවරණය පිළිබඳ වැඩි විස්තර සඳහා කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 01 බලන්න)*

## විධිවිධාන:

රක්ෂණ සමාගමේ වගකීම එක් එක් කොටස් සඳහා උපලේඛනයේ සඳහන් කර ඇති හානිපූරණ සීමාවට සීමා කරනු ලැබේ.

## ආවරණය නොවන දේ (පොදු ව්‍යතිරේක):

1. හයිඩ්‍රොලික් පරීක්ෂණය අතරතුර යන්ත්‍රෝපකරණ හෝ රක්ෂිතයාට අයත් අනෙකුත් දේපල වලට සිදුවන හානිය.
2. රක්ෂිතයාට අයත් යන්ත්‍රෝපකරණ හෝ වෙනත් දේපල භාවිතය අහිමි වීම හෝ රක්ෂිතයාට සිදුවන වෙනත් අනුෂංගික අලාභ.
3. යන්ත්‍රෝපකරණවල අන්තර්ගතය රසායනික ක්‍රියාවලියකින් හෝ ජ්වලනයකින් සිදුවන පිපිරීමක් හෝ කඩා වැටීමකින් සිදුවන හානිය හෝ වගකීම.
4. රක්ෂිතයා විසින් ගිවිසුමක් හෝ එකගතාවයක් මගින් භාරගත් වගකීම, එම ගිවිසුම නොතිබුණද නිත්‍යයානුකූලව රක්ෂිතයාට අදාල වන වගකීමක් නොවේ නම්, මෙම රක්ෂණ ආවරණයට ඇතුලත් නොවේ

**People's Insurance PLC,** No. 07, Havelock Road, P.O. Box 215, Colombo 05.
Tel: +94 11-2126 126 | Fax: +94 11-2126 109 | E-mail: pilassist@plc.lk | www.peoplesinsurance.lk
(A Subsidiary of People's Leasing & Finance PLC and People's Bank) - Company No. PB 3754 PQ



5. පහත සඳහන් කාරණාවල සෘජුව හෝ වක්‍රව හෝ එහි අනුෂංගයක් ලෙස හෝ ඒ හරහා ඇතිවන අලාභය, විනාශය, හානිය හෝ වගකීම:
   අ) යුද්ධය, ආක්‍රමණය, විදෙස් සතුරු ක්‍රියා, සතුරුකම් හෝ යුද්ධයට සමාන මෙහෙයුමක්, (යුද්ධයක් ප්‍රකාශ කර තිබුණත් නැතත්) සිවිල් යුද්ධය,
   ආ) කැරලි කෝලාහක, සිවිල් කැලඹීම, හමුදා නැගිටීමකට, කැරැල්ලකට, මිලිටරි හෝ බලය පැහැර ගැනීමකට තුඩු දිය හැකි යයි උපකල්පනය කළ හැකි මහජන නැගිටීම
   ඇ) නීත්‍යානුකූල හෝ තත්ත්වික රජයක් බලයක් යොදා බලයෙන් පහකිරීම දක්වා හෝ ත්‍රස්තවාදයෙන් හෝ ප්‍රචණ්ඩත්වයෙන් එයට බලපෑම් කිරීම දක්වා යොමු කිරීම සඳහා ක්‍රියා කරන ඕනෑම සංවිධානයක් වෙනුවෙන් හෝ ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරන ඕනෑම පුද්ගලයෙකුගේ ක්‍රියාවක්.

   ඉහත 5 අ), ආ) සහ ඇ) ව්‍යතිරේක විධිවිධාන හේතුවෙන් කිසියම් අලාභයක්, විනාශයක්, හානියක් හෝ වගකීමක් මෙම රක්‍ෂණයෙන් ආවරණය නොවන බව පවසා සමාගම විසින් ක්‍රියාත්මක කර ඇති ඕනෑම ක්‍රියාවලියක්, නඩුවක් හෝ වෙනත් ක්‍රියාමාර්ගයකදී එවැනි අලාභයක්, විනාශයක්, හානියක් හෝ වගකීමක් ආවරණය කර ඇති බව ඔප්පු කිරීමේ වගකීම රක්ෂිතයා සතු වේ.

6. අ) ඕනෑම දේපලකට සිදුවන පාඩුව හෝ විනාශය හෝ හානිය හෝ ඒ හරහා හෝ එහි අනුෂංගයක් වශයෙන් ඇතිවන ඕනෑම අලාභයක් හෝ වියදමක්.
   ආ) න්‍යෂ්ටික ඉන්ධනයකින් හෝ න්‍යෂ්ටික ඉන්ධන දහනය කිරීමෙන් ඇතවන ඕනෑම න්‍යෂ්ටික අපද්‍රව්‍යයකින් හෝ අයනීකරණ විකිරණ හෝ විකිරණශීලී තාවයෙන් දූෂණය වීමෙන් සෘජුව හෝ වක්‍රව ඇතිවන හෝ දායකවූ හෝ පැන නගින ඕනෑම ස්වභාවයක නෛතික වගකීමක්. මෙම ව්‍යතිරේකය අදාළ වන විටදි පමණක්, ස්වයංක්‍රිය න්‍යෂ්ටික විඛණ්ඩන ක්‍රියාවලියක්ද, "දහනය" ලෙස සලකනු ලබයි
7. න්‍යෂ්ටික අවි ද්‍රව්‍ය නිසා සෘජුව හෝ වක්‍රව සිදුවන හෝ දායකවූ හෝ පැන නගින ඕනෑම අලාභයක්, විනාශයක්, හානියක් හෝ නීතිමය වගකීමක්,
8. ටයිෆූන්, චණ්ඩමාරුත, ගිනිකඳු පිපිරීම්, භූමිකම්පාව හෝ ස්වභාවධර්මයේ වෙනත් කම්පනයක් හේතුවෙන් සෘජුව හෝ වක්‍රව, ආසන්නව හෝ දුරස්ථව සිදුවූ හෝ දායකවූ සම්භවය අහිමිවීම හෝ හානි වීම.

*(ව්‍යතිරේක පිළිබඳ වැඩි විස්තර සඳහා කරුණාකර ඔප්පුවෙහි "ව්‍යතිරේක" කොටස බලන්න)*

<u>**වාරික ගෙවීමේ ක්‍රමය:**</u>

ඔප්පුව සඳහා වාරිකය සහ ඉන් අනතුරුව කෙරෙන අලුත් කිරීමකදී (ඔප්පු උපලේඛනයේ වෙනත් ආකාරයකින් සඳහන් කර නොමැති නම්) වාර්ෂිකව ගෙවිය යුතුය.

<u>**හිමිකම් ක්‍රියා පටිපාටිය සහ අවශ්‍ය ලියකියවිලි:**</u>

මෙම ඔප්පුව යටතේ හිමිකම් පෑමකට තුඩු දිය හැකි ඕනෑම සිදුවීමක් පිළිබඳව රක්‍ෂණ සමාගමට වහාම දැනුම් දිය යුතුය. ඕනෑම සිදුවීමක් ඇතිවී දින තිහක් (30) ඇතුලත නිසි පරිදි සම්පූර්ණ කරන ලද හිමිකම් පෝරමයක් සමග පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය:

1. අලාභය/හානිය පිළිබඳව ඔබ දැනගත් වහාම 011-2206306 යන අංකය ඔස්සේ අප අමතන්න.

2. නීතියෙන් නියම කර ඇති පරිදි (සොරකමක්, ද්වේෂසහගත හානියක්, කැරළි කෝලාහල සහ වැඩවර්ජන, ගිනි තැබීම් හෝ සැකසහිත ගිනි තැබීමකදී වැනි) සිද්ධිය පිළිබඳව ළඟම ඇති පොලිස් ස්ථානයට වාර්තා කරන්න.
3. තෙවන පාර්ශවයක් විසින් කිසියම් හිමිකම් පෑමක් සිදු කරන්නේ නම්, කිසිම පොරොන්දුවක් ඔවුනට ලබා නොදී එය අප වෙත යොමු කරන්න.
4. මෝටර් රථවාහන නොවන හිමිකම් දෙපාර්තමේන්තුව විසින් එවනු ලබන හිමිකම් පෝරමය පුරවා ඔබගේ හිමිකම් ගෙවීම වේගවත් කිරීම සඳහා ඉල්ලා සිටින අනෙකුත් ලියකියවිලි සමග එය හැකි ඉක්මණින් ආපසු එවන්න.
5. දේපල පිළිබඳ හිමිකම් පෑමක් නම්, හානිවූ දේපල නිරීක්ෂණය කිරීම සඳහා තක්සේරුකරුවෙක් හෝ විමර්ශන නිලධාරියෙක් හැකි ඉක්මණින් යවනු ලැබේ.
6. අලාභය/හානිය තක්සේරු කිරීම අලාභයේ ස්වභාවය අනුව සුදුසු අලාභ තක්සේරුකරුවෙක් විසින් සිදු කරනු ලැබේ.
7. අවශ්‍ය ලියකියවිලි:
   - නිසි පරිදි සම්පූර්ණ කරන ලද හිමිකම් පෝරමය
   - අදාළ වන්නේ නම්, පොලීසියට කරන ලද පැමිණිල්ලෙහි පිටපතක්
   - ඇස්තමේන්තු සහ බිල්පත්
   - හිමිකම් පෑම සැකසීමේදී රක්ෂණ සමාගමට අවශ්‍ය විය හැකි වෙනත් ඕනෑම ලියවිල්ලක්

*(වැඩි විස්තර සඳහා කරුණාකර ඔප්පුවෙහි "කොන්දේසි" කොටස බලන්න)*

**<u>වංචාව:</u>**

රක්ෂිතයා විසින් හෝ ඔහු වෙනුවෙන් කරන ලද කිසියම් හිමිකම් පෑමක් කිසියම් ආකාරයකින් පදනම් විරහිත, වංචනික හෝ හිතාමතාම අතිශයෝක්තියෙන් දක්වා ඇත්නම්, හෝ එයට සහාය දැක්වීම සඳහා ව්‍යාජ ප්‍රකාශයක් කර ඇත්නම්, මේ යටතේ කිසිදු හිමිකම්පෑමක් අයකරගත නොහැකි වනු ඇත.

*(වැඩි විස්තර සඳහා කරුණාකර ඔප්පුවෙහි "කොන්දේසි" කොටස බලන්න)*

**<u>ඔප්පු හිමියාගේ වගකීම්:</u>**

- සමාගමේ නිලධාරීන්ට සෑම සියලු සාධාරණ අවස්ථාවකම යන්ත්‍රෝපකරණ පරීක්ෂා කිරීමට සහ නිරීක්ෂණය කිරීමට අයිතියක් ඇති අතර, රක්ෂිතයා විසින් සිදු කරනු ලබන ඕනෑම කොටස් ගැලවීමක් සහ නැවත එකලස් කිරීමක් සම්බන්ධයෙන්ද සමාගම සහ රක්ෂිතයා අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වන දිනයක හෝ දිනවල පරීක්ෂා කිරීමට සහ නිරීක්ෂණය කිරීමට අයිතියක් ඇත.
- රක්ෂිතයා සෑම විටම නිසිපරිදි යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කිරීමට අවශ්‍ය නොවන තත්ත්වයක තබා ගැනීමට පූර්වාරක්ෂක පියවර ගත යුතු අතර හානි හෝ අනතුරුවලට එරෙහිව සියලු නිසි ආරක්ෂණ ක්‍රම සියලුම පුද්ගලයින් විසින් පිළිපැදීම සහ යන්ත්‍රෝපකරණ ක්‍රියාත්මක කිරීම සහ පරීක්ෂා කිරීම සම්බන්ධ සියලුම රජයේ සහ අනෙකුත් රෙගුලාසි පිළිපදින බව සහතික කළ යුතුය.
- කිසියම් යන්ත්‍රෝපකරණ අයිතමයක් හෝ අයිතමයන් සම්බන්ධයෙන් රක්ෂිතයා මෙම කොන්දේසියට අනුකූල වීමට අපොහොසත් වුවහොත්, එවැනි අයිතමය හෝ අයිතමයන්

සඳහා මෙම ඔප්පුව මගින් ලබා දී ඇති සියලුම රක්ෂණ වහාම අත්හිටවනු ලැබේ. ඕනෑම යන්ත්‍රෝපකරණ අයිතමයක ආරක්ෂිත කපාට මත පීඩනය හෝ බර, නිෂ්පාදකයින් විසින් නිශ්චිතව දක්වා ඇති පීඩනය හෝ අදාළ යන්ත්‍රෝපකරණවල අවසාන පරීක්ෂණ වාර්තාවේ දක්වා ඇති අවසර ලත් වැඩ පීඩනයේ අගය ඉක්මවා නොයා යුතුය.

- රක්ෂිතයා විසින් අවදානමට හෝ හානියට බලපාන ඕනෑම දෝෂයක් හෝ සේවා කොන්දේසි පිළිබඳව සමාගමට දැනුම් දිය යුතු අතර, තත්ත්වයන්ට අවශ්‍ය වන පරිදි අමතර පූර්වාරක්ෂාවන් ගැනීමට පිවර ගත යුතුය. සමාගමේ අනුමැතිය නොමැතිව සාමාන්‍ය සේවා කොන්දේසිවලින් බැහැරවීම නිසා සිදුවන ඕනෑම හානියක් හෝ වගකීමක් සඳහා සමාගම වගකිව යුතු නොවන අතර, සමාගම පූර්ව අවසරයක් ලබා දී නොමැති නම් එය උග්‍ර අවදානමක් ඇති කරයි.

## වැදගත් තොරතුරු හෙළිදරව් කිරීම පිළිබඳව ඔප්පු හිමියාගේ වගකීම

- මිලදී ගන්නා අවස්ථාවේදී:- ඕනෑම හිමිකම් ප්‍රතික්ෂේප කිරීමක් වලක්වා ගැනීම සඳහා යෝජනාපත්‍රයේ ඉල්ලා ඇති සියලුම වැදගත් කරුණු සත්‍ය හා නිවැරදිව හෙළි කරන්න.

- ඔප්පු කාලසීමාවේදී:- අවදානමේ හෝ පුද්ගලික තොරතුරුවල සිදුවන සැලකිය යුතු වෙනස්කම් පිළිබඳව රක්ෂණ සමාගම දැනුවත් කල යුතුය.

## හිමිකම් පෑමක් කරන විට ඔප්පු හිමියාගේ වගකීම

- හිමිකම් පෑමක් කරන විට:- හිමිකම් පෝරමය සමග හිමිකම් ක්‍රියා පටිපාටියේ සඳහන් කර ඇති පරිදි අවශ්‍ය සියලුම ලියකියවිලි සහ විස්තර සපයන්න.

## <u>පැමිණිලි පිළිබඳ ක්‍රියා පටිපාටිය:</u>

අපි ඔබට සේවය කිරීමට කැපවී සිටින අතර ඔබගේ අදහස්/යෝජනා ලබාගැනීමට කැමැත්තෙන් සිටින්නෙමු. අපගේ සේවාවන් පිළිබඳව ඔබ සෑහීමකට පත් නොවන්නේ නම්, ඔබට පහත ක්‍රම මගින් පැමිණිල්ලක් ඉදිරිපත් කල හැකිය:

- දුරකතනයෙන් - පාරිභෝගික සේවා නිලධාරි - 011 2126136
- ඊ-මේල් මගින් - pilassist@peoplesinsurance.lk
- වට්ස්ඇප් මගින් - 0716230048
- ෆැක්ස් මගින් - 011 2126109
- තැපැලෙන් - පාරිභෝගික සේවා නිලධාරි, පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී., අංක 07, හැව්ලොක් පාර, කොළඹ 05
- මාර්ගගත ක්‍රමය මගින් - පැමිණිලි ඉදිරිපත් කිරීමේ පෝරමය අපගේ වෙබ් අඩවියෙන් www.peoplesinsurance.lk ලබාගත හැකිය. කරුණාකර "පැමිණිලි" ටැබ් එක මත ක්ලික් කරන්න
- අපගේ ප්‍රධාන කාර්යාලය වෙත පැමිණීමෙන්

පැමිණිල්ලක ඉදිරිපත් කරන අවස්ථාවේදී පහත සඳහන් තොරතුරු ලබා දිය යුතුය:-

i. පැමිණිල්ල කෙටියෙන්
ii. ඔබගේ නම සහ ඔබ හා සම්බන්ධ විය හැකි තොරතුරු

iii. යොමුව: ඔප්පු අංකය / වාහන අංකය / හිමිකම් අංකය
iv. සනාථ කෙරෙන ඕනෑම ලියවිලි

පැමිණිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටිය භාෂා ත්‍රිත්වයෙන්ම අපගේ www.peoplesinsurance.lk වෙබ් අඩවියෙන් භාගත කල හැකිය. කරුණාකර "පැමිණිලි" ටැබ් එක මත ක්ලික් කරන්න

**ආරවුල් විසඳීම:**

ඉදිරිපත් කරන ලද පැමිණිල්ලක් සඳහා අප විසින් ලබා දී ඇති විසඳුම පිළිබඳව ඔබ සෑහීමකට පත් නොවන්නේ නම්, පහත සඳහන් විකල්ප ආරවුල් විසඳීමේ යාන්ත්‍රණයන් භාවිතා කිරීමට ඔබට හැකියාවක් ඇත:

i. ඔබගේ ගැටළු පහත ලිපිනයට යොමු කරන්න:-

ශ්‍රී ලංකා රක්ෂණ ඔම්බුඩ්ස්මන්
අංක 1, බෙතෙස්ඩා පෙදෙස, කොළඹ 05

info@insuranceombudsman.lk
011 2505542 / 011 250 5041

ii. බේරුම්කරණය:- ඔප්පුවේ බේරුම්කරණ වගන්තියට අනුව

iii. ඔබගේ ගැටළු පහත ලිපිනයට යොමු කරන්න:-

අධ්‍යක්ෂ විමර්ශන
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව
11 වෙනි මහල, නැගෙනහිර කුළුණ,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය,
කොළඹ 01
011 2396184-9 / 011 2335167
investigation@ircsl.gov.lk / info@ircsl.gov.lk

*කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 13 සහ 14, "පැමිණිලි ක්‍රියාපටිපාටිය" කොටස බලන්න*

**මතක තබා ගත යුතු කරුණු කිහිපයක්**

**රක්ෂණය අවලංගු කිරීම:**

රක්ෂිතයාගේ ඉල්ලීම පරිදි මෙම රක්ෂණය ඕනෑම අවස්ථාවක අවසන් කල හැකි අතර, එවැනි අවස්ථාවකදී කිසිදු හිමිකම් පෑමක් කර නොතිබීමට යටත්ව, රක්ෂණ සමාගම විසින් ඔප්පුව ක්‍රියාත්මකව පැවති කාලය සඳහා සාමාන්‍ය කෙටි කාලීන අනුපාතයක් රඳවා ගනු ඇත. රක්ෂිතයාට දැනුම් දීමෙන් පසු රක්ෂණ සමාගමේ කැමැත්ත පරිදි ඕනෑම අවස්ථාවක මෙම රක්ෂණය අවලංගු කල හැකි අතර, එවැනි අවස්ථාවකදී අවලංගු කිරීමේ දින සිට කල් ඉකුත් නොවූ කාලය සඳහා ඉල්ලා සිටි විට වාරිකයෙන් සමානුපාතික කොටසක් ආපසු ගෙවීමට රක්ෂණ සමාගම බැඳී සිටී.

- මෙම ඔප්පුවේ නියමයන් සහ කොන්දේසි නිසි ලෙස පිළිපැදීම සහ ඉටු කිරීම මෙම ඔප්පුව යටතේ ඕනෑම ගෙවීමක් කිරීමේ සමාගමෙහි ඕනෑම වගකීමකට පූර්ව කොන්දේසියක් වනු ඇත.
- වාරික ගෙවීම:- රක්‍ෂණ ඔප්පුවෙහි වාරික ගෙවීමේ ප්‍රතිඥාභාරයට අනුකූල විය යුතුය.
- රක්ෂිතයා විසින් රක්ෂිත දේපලට සිදුවන අලාභය හෝ හානිය වැළැක්වීමට හෝ අවම කිරීමට සියලු සාධාරණ පූර්වාරක්‍ෂක පියවර ගත යුතුය.

*කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 03, කරුණු අංක 11 යටතේ "කොන්දේසි" කොටස බලන්න*

**<u>වැදගත් සටහන්:</u>**

රක්‍ෂණ සැලසුම් පිළිබඳ තොරතුරු ලේඛනය (IPID) හි අරමුණ වන්නේ මූලික ආවරණය සහ අමතර ආවරණවල (අදාල වේ නම්) සහ ඔප්පුවේ ප්‍රධාන ලක්‍ෂණ පිළිබඳ සාරාංශයක් ලබා දීම වන අතර එය ඔබගේ නිශ්චිත පුද්ගලික අවශ්‍යතාවන් සඳහා සකස් කරන ලද්දක් නොවන බව සලකන්න. මෙම රක්‍ෂණයට අදාල ඕනෑම ආකාරයක සියලු කාරණා (හිමිකම් පෑම්, නියමයන් සහ කොන්දේසි පිළිබඳ අර්ථකථන සහ නීතිමය කටයුතු වැනි එහෙත් ඒවාට පමණක් සීමා නොවූ) මෙම ලේඛනයෙහි අන්තර්ගතය අභිබවා බලපැවැත්වෙන මූලික රක්‍ෂණ ඔප්පුවේ නියමයන්, කොන්දේසි සහ ව්‍යතිරේක මගින් පාලනය වන බව කරුණාවෙන් සලකන්න.

**<u>වැඩිදුර තොරතුරු සඳහා:</u>**

ඔබට වැඩිදුර තොරතුරු අවශ්‍ය නම්, පහත සඳහන් මාර්ග ඔස්සේ එය ලබා ගත හැකිය:

- දුරකතනය - 0112126126
- ඊ-මේල් - pilassist@peoplesinsurance.lk
- දිවයින පුරා පිහිටි අපගේ ශාඛා කාර්යාලයන් වෙත පැමිණීමෙන්